# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

## රත්නපුර, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විගමනික සම්පත් මධ්‍යස්ථානය සඳහා යෝජිත මලාපවහන සහ අපජල පිරිපහදු පද්ධතිය ඉදිකිරීම

## කොන්ත්‍රාත් අංකය - PR/02/05/33 Vol. II

01. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC) විසින්, රත්නපුර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විගමනික සම්පත් මධ්‍යස්ථානය සඳහා යෝජිත මලාපවහන සහ අපජල පිරිපහද පද්ධතිය ඉදිකිරීම සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. නැවත නොගෙවන ටෙන්ඩර් ගාස්තුව රුපියල් විසි දහසක් (රු. 20,000.00) මුදලින් ගෙවීමෙන් 2026.01.29 දින සිට 2026.02.17 දින දක්වා බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ, ප්‍රසම්පාදන අංශයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් ලංසු ඉදිරිපත් කළ යුතුය.

03. යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**ලංසුකරුගේ සුදුසුකම්**

කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, පහත අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය.

- මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) මලාපවහන හා පිරිපහදු පද්ධතිය සහ ඒ ආශ්‍රිත සේවා සඳහා වන උපදේශක කාණ්ඩය යටතේ ලියාපදිංචි වී තිබිය යුතුය.

  ශ්‍රී ලංකාවේ සමාගමක් ලෙස ලියාපදිංචි වී තිබිය යුතු අතර, අවම වශයෙන් වසර 06ක පළපුරුද්දක් සම්පූර්ණ කර තිබිය යුතුය. එය සනාථ කිරීමේ අදාළ සහතික ඉදිරිපත් කිළ යුතුය.

- සියලුම ලංසුකරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) C5 හෝ ඉහළ ශ්‍රේණියක් සඳහා ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

- ලංසු මිල රුපියල් මිලියන 5.0 ඉක්මවන සෑම ලංසුවක් සඳහාම ලංසුකරුවන් 1987 අංක 03 පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරනු ලබන වලංගු සහතිකයක් ලබාගත යුතුය.

  කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසුකරු පහත සඳහන් අවම සුදුසුකම් නිර්ණායක සපුරා තිබිය යුතුය.

- පසුගිය වසර තුන තුළ ඉටුකරන ලද ඉදිකිරීම් කර්මාන්තයන්ගේ සාමාන්‍ය වාර්ෂික වටිනාකම අවම වශයෙන් රුපියල් මිලියන 100.0ක් විය යුතුය.

- පසුගිය වසර පහ ඇතුළත ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස සමාන ස්වභාවයේ සහ සංකීර්ණත්වයෙන්යුත් ව්‍යාපෘති වටිනාකම අවම වශයෙන් රුපියල් මිලියන 50.0ක් වන කොන්ත්‍රාත්තුවක් මාස 3 සිට 6 දක්වා කාලයේදී සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතුය. නැතහොත් ඉහළ වටිනාකමක ව්‍යාපෘතියක් අනුපාතික කාලයකදී සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතුය.

- පසුගිය වසර පහ ඇතුළත ආයතනය විසින් පුද්ගලික අංශයේ හෝ රාජ්‍ය අංශයේ සමාන ස්වභාවයේ සහ සංකීර්ණත්වයෙන් යුත් ව්‍යාපෘති අවම වශයෙන් දෙකක් සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතුය.

- යෝජිත නිර්මාණ කණ්ඩායමේ සෑම සාමාජිකයෙකුම තමන් යෝජනා වී ඇති කාර්යයට සමාන ස්වභාවයේ සහ සංකීර්ණත්වයෙන් යුත් නිර්මාණ කාර්යයන් අවම වශයෙන් දෙකක් පසුගිය වසර පහක කාලය තුළ සිදුකර තිබිය යුතුය.

- මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීමට සිදුවන ඕනෑම අත්තිකාරම් මුදලක් සහ අනෙකුත් කෙන්ත්‍රාත් වගකීම්වලින් තොරව තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ/ හෝ ණය පහසුකම් හි අගය රුපියල් මිලියන 50ට නොඅඩු විය යුතුය.

- ලංසුකරු විසින්, 2024 ප්‍රසම්පාදන අත්පොතට අනුකූලව ලංසු ලිපිලේඛනයෙහි අමුණා ඇති ආකෘතියෙන් යුත් දූක්සන්ධානය නොවීමේ දිවුරුම් ප්‍රකාශයක් ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.

04. ඔබට අවශ්‍ය වැඩිදුර තොරතුරු බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, 234, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, කළමනාකරු (ප්‍රසම්පාදන) වෙතින් ලබාගත හැකි අතර, දුරකථන : 0112880550, ඊමේල් mgr_procurement@slbfe.lk 2026.01.29 සිට 2026.02.17 දක්වා පෙ.ව. 09.00 සිට ප.ව. 3.00 දක්වා ලංසු ලිපි ලේඛන පරීක්ෂාකර බැලීම සහ ලබාගැනීම සිදුකළ හැක.

05. බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, 234, ශ්‍රී ලංකා විදේ සේවා නියුක්ති කාර්යාංශය, කළමනාකරු (ප්‍රසම්පාදන) වෙතින් ගාස්තු ගෙවීමකින් තොරව ලංසු ලිපි ලේඛන පරීක්ෂාකරට බැලිය හැක.

06. 2026.05.20 දින දක්වා (ලංසු අවසන් කරනු ලබන දිනයේ සිට දින 91 ක්) ලංසු වලංගු විය යුතුය.

07. සියලුම ලංසු සමග රුපියල් 500,000.00ක වටිනාකමින්යුත් 2026.06.17 දින දක්වා (ලංසු අවසන් කරනු ලබන දිනයේ සිට දින 119ක්) වලංගු ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය.

08. මුද්‍ර, තබන ලද ලංසු, බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රසම්පාදන අංශයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි බහාලිය යුතුය.

09. ඉදිකිරීම් කාලය දින 90කි.

10. පූර්ව ලංසු රැස්වීමක් 2026.02.06 දින පෙ.ව. 10.30ට රත්නපුර, නව නගරය, විද්‍යාලය මාවත, 89/6, ස්ථානයේදී පැවැත් වේ.

11. ලංසු භාරගැනීම 2026.02.18 දින පෙ.ව. 11.00ට අවසන් කරනු ලබන අතර, ඒ හා වහාම ලංසු විවෘත කරනු ලැබේ.

12. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගීවන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC),**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**
**දුරකථන : 011-2880550**

එතෙර සවියට මෙතර අත්වැල